# ලංකාණ්ඩුවේ “ගැසට්” පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 8,615—1940ක්වූ මැයි මස 17 වෙනි දිනවූ සිකුරාදා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## උපාංග නීති.

M. L. A.—B 699
L. D.—B 15/40

### බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනත.

හැටන්-දික්ඔයේ නගරබද සභාවේ පාලන බලය පවත්නා සීමාඇතුළත ප්‍රදේශයට බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ (334 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා සම්පාදනයකිරීමට බලයලත් නියම නිලධාරීතැන විසින් එනම්, හැටන්-දික්ඔයේ නගරබද සභාවේ ප්‍රධානතුමා විසින් එකී ප්‍රදේශය වෙනුවෙන් සම්පාදිත අතුරු ව්‍යවස්ථා.

සී. ඇස්. සමරවීර,
ප්‍රධානතැන.

1940 මැයි මස 6 වැනි දින හැටන්-දික්ඔයේ නගරබද සභාවේ කාර්‍යාලයේදීය.

### අතුරු ව්‍යවස්ථා.

1. මේ අතුරු ව්‍යවස්ථාවල—

“ප්‍රධානතුමා” යනුවෙන් හැටන්-දික්ඔය නගර සභාවේ ප්‍රධානතුමාද;

“අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව” යනුවෙන් ආඥාපනතේ 4 වැනි වගන්තිය යටතේ අයකළයුතු අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුවද;

බල්ලකු සම්බන්ධයෙන් “අයිතිකාරයා” යනුවෙන් ඒ බල්ලා භාරව හෝ අයිතිකරගෙන හෝ සිටින අයද;

අදහස්කරනු ලැබේ.

2. (1) වයස 6 මසකට වැඩිවූ යම් බල්ලකු නවාගෙන සිටින ගෙයක හෝ ස්ථානයක පදිංචිකාරයා විසින් එක් එක් අවුරුද්දේ මාර්තු මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රධානතුමා වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ තිබෙන පෝරමයේ ප්‍රකාර වාර්තාවක් සැපයිය යුතුයි.

(2) යම් අවුරුද්දක මාර්තු මස 1 වැනිදසින් පසු යම් අයකු විසින් යම් ගෙයක හෝ ස්ථානයක බල්ලකු නවාගැනීමට පටන්ගත්විට ඒ ගෙයි හෝ ස්ථානයේ පදිංචිකාරයා විසින් ප්‍රධානතුමා වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ තිබෙන පෝරමයේ ප්‍රකාර පැමිපුර වාර්තාවක් වහාම සැපයිය යුතුයි.

3. එක් එක් බල්ලාගේ අයිතිකාරයා විසින් අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව—

(a) 2 (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වාර්තාවක් සපයන ලද බල්ලකු සම්බන්ධයෙන්වූවිට ගාස්තුව අයවියයුතු අවුරුද්දේ අප්‍රේල් මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන්; හෝ

(b) 2 (2) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ පැමිපුර වාර්තාවක් සපයනලද බල්ලකු සම්බන්ධයෙන් වූවිට ඒ පැමිපුර වාර්තාව සපයනලද දිනයෙහි සිට පසළොස් දිනක් ඇතුළතදී;

ගෙවිය යුතුයි.

4. අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව ගෙවූවිට ප්‍රධානතුමා විසින් බල්ලා අයිතිකාරයාට—

(i.) ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක්, හා

(ii.) සහතිකපත්‍රයේ අංකය සහා ඇති විකෑම් තහඩුවක් හෝ කරපටියක්,

නිකුත්කළ යුතුයි.

එහෙත් ප්‍රධානතුමා විසින්, ලියාපදිංචිකිරීම සඳහා ඉල්ලීමක් කළ ඕනෑම බල්ලකු පෙන්නාසිටීමට නියමකිරීමත්,

(a) ඒ බල්ලා පෙන්නා නොසිටියහොත් නම්; හෝ

(b) ප්‍රධානතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අබාධ වී කලවූ හෝ රෝග සහිතවූ හෝ වෙනත් බල්ලන්ට බෝවිය හැකියේ යම් රෝගයකින් පෙළෙන්නාවූ සතෙක් වේනම්; හෝ

(c) අයිතිකාරයා විසින් ඒ බල්ලාට නිතරම සිරිනක් ලෙස හිංසාකරනු ලැබේනම් නැතහොත් ඌ නොසලකා හරිනු ලැබේ නම්;

ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් හා විකෑම් තහඩුවක් හෝ කරපටියක් ඒ බල්ලා වෙනුවෙන් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමත්, කළහැකියි.

5. ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් නිකුත්කර තිබෙන යම් බල්ලකුගේ අයිතිකාරයාගේ පදිංචි ස්ථානයෙහි දුක්වීමක් (නොතීසියක්) තිබෙන්නට හැර ආවාට පසු ප්‍රධානතුමා විසින් ඒ සහතිකපත්‍රය—

(a) ප්‍රධානතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අබාධවී කලව හෝ රෝග සහිතව සිටිනම්; හෝ

(b) අයිතිකාරයා විසින් ඒ බල්ලාට සිරිතක් ලෙස නිතරම හිංසාකරනු ලැබේනම් නැතහොත් ඌ නොසලකා හරිනු ලැබේනම්; හෝ

(c) ඒ බල්ලා ව්‍යාධයෙන් හෝ සාගීයෙන් බෝවන රෝගයකින් පෙළෙමින් සිටියදී අයිතිකාරයා විසින් ඌට වෙනයම් බල්ලකු සමග එකට හැසිරීමට අවකාශ දෙනු ලැබේ නම්; හෝ

(d) ඒ බල්ලා විකෑවී තහඩුවක් හෝ කරපටියක් නැතුව දඩාවතේ යන බැව් දකින්නට ලැබේනම්;

අවලංගුකළ හැකිසි.

6. (1) 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් දීම ප්‍රතික්ෂේපකර ඇත්තාවූ හෝ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ සහතිකපත්‍රය අවලංගුකර ඇත්තාවූ හෝ යම් බල්ලකුගේ අයිතිකාරයා විසින් තමාට ඒ සම්බන්ධයෙන් ප්‍රධානතුමා විසින් දැන්වීමක් (නොතීසියක්) භාරකරවූවිට ඒ දැන්වීමෙහි සඳහන්වන්නාවූ වේලාවේදීත් ස්ථානයේදීත් ඒ බල්ලා ගෙනවුත් පෙන්නාසිටිය යුතුයි.

(2) ප්‍රධානතුමාට සුදුසුයයි කල්පනාවන හැටියකින් එවැනි සෑම බල්ලකුම විනාශකිරීම හෝ ඌට වෙනයම් සුදුස්සක් හෝ කළහැකිසි.

7. විකෑවී තහඩුවක් හෝ කරපටියක් නියුක්තකර ඇති කවර බල්ලකුගේ වුවත් අයිතිකාරයා විසින් ඒ බල්ලා සම්බන්ධයෙන් නිකුත්කරනලද ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රය වලංගුව පවතින කාලයතුළ සෑම විටෙකම ඒ බල්ලාගේ කරේ ඒ විකෑවී තහඩුව හෝ කරපටිය හොඳින් සවිකොට තිබෙන බැව් දැක්මට වුවමනා සෑම අනුමිත්ම ක්‍රියාකළ යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රධානතුමා කෙරෙහි පවරන ලද බලවලින් කිසිවක් හෝ සියල්ලම පාවිච්චිකිරීමට ප්‍රධානතුමා විසින් යම් අයකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිසි.

9. අංක 8,267 හා 1937 ජනවාරි මස 15 වැනි දින දරණ ගැසට් පත්‍රයෙහි පළවූ බල්ලන් ලියාපදිංචිකිරීම පිළිබඳවූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

උප ලේඛනය.

පෝර්මය.

අංකය :——.
ගෙයි අංකය :————.
වීදිය :————.
ගමේ නම :————.
වත්තේ නම :————.
ගෘහමූලිකයාගේ නම :————.

අංකය :——.
19—මාර්තු මස 1 වෙනිදා හෝ ඊට ප්‍රථමයෙන් සම්පූර්ණකොට ප්‍රධානතැන වෙත ආපසු යැවිය යුතු වාර්තාවයි.
ගෙයි අංකය :————.
වීදියේ අංකය :————.
ගමේ නම :————.
වත්තේ නම :————.
ගෘහමූලිකයාගේ නම :————.

| තබාගෙන සිටින බල්ලන්ගේ ගණන | විස්තරය | | | | වෙනත් කරුණු | අයිතිකාරයාගේ නම | ලබන අප්‍රේල් මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් ගෙවීමේ දිනය |
|---|---|---|---|---|---|---|---|
| | වර්ගය | ගැහැනුසතාද පිරිමිසතාද යන බව | පාට | බෙල්ලේ මහත විශේෂ ලක්ෂණ | | | |
| | | | | | | | |

භාරදුන් දිනය :
19——.

භාරදුන් දිනය :
19——.

————.
ගෘහමූලිකයාගේ අත්සන.

————,
භාරදෙන අයගේ අත්සන.

නියමිත දිනදී හෝ ඊට ප්‍රථමයෙන් මේ වාර්තාව සම්පූර්ණකොට ආපසු නොයැවීම ගැන දඩුවමක් වශයෙන් රුපියල් 20කට වැඩි නැති දඩයක් ගැසිය හැකිසි.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූලි මස 25වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 10ට මෙහි පහත දක්වන ආණ්ඩුව සන්තක බිම් කැබැල්ලේ බද්ද කුරුණෑගල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කුවේ දේවමැදිහත්පත්තුවේ පිහිටා තිබෙන බිම් කැබලි එකක්.

නො. 1,809 අවසාන ගම් සිතියම. ගම—ගිරතලානකෝරලේ මඩලුන්න යන ගම.

| බිම් කැබැල්ලේ නොම්මරය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකම්කියන්නා. | අන්දම. | ප්‍රමාණය, අ. රූ. ප. | අක්කරයක හක්සේරු බදු මුදල රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 6 | දන්ගස්වැව්සියේහේන් යාය, සියඹලාගහ මුලහේන්යාය | ඒ. රුළිගු මහත්මයා .. | ආණ්ඩුව .. | මුඩුබිම .. | 36 1 34 | 2 0* |

* අක්කරයක හක්සේරු මුදල රුපියල් 30යි.

(a) නියම බදුකාලය අනූනමඅවුරුදු බද්ද.

(b) පළමු තිස්අවුරුද්දතුළ බදුමුදල හක්සේරුකළ මුදලෙන් සියයට හයක් වේ. නමුත් මුල් හයඅවුරුද්දට අවුරුදුපතා ගෙවියයුතු බදු මුදලෙන් තුනෙන් පංගුවක් අයකරනු ලැබේ.

(c) සෑම තිස්අවුරුද්දකට වරක් බද්ද අලුත්කළ යුතුය.

(d) බද්දේදී අන්දම්, පොල් වැවීමට.

ඉහත සඳහන් බිම්කෑල්ලිය සම්බන්ධව වැඩිදුරට කාරණා වයඹ පළාතේ ඒජන්තතුමාගෙන් දැනගැනීමට සහ සිතියමේ පිටපත් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන් ලබාගැනීමටත් පුළුවන.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 22වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුව සන්තක ඉඩම්වල මිනිරන් හෑරීමේ බල බදුදීමේ දැන්වීමයි.

වර්ෂ 1940ක්වූ ජූනි මස 14වෙනි දින පෙරවරු 10ට රත්නපුරේ කච්චේරියේදී මීට යාකරණ උප ලේඛනයේ විස්තර වන ආණ්ඩුව සන්තක ඉඩම්වල මිනිරන් හෑරීමේ බල රත්නපුරේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් ආණ්ඩුව සන්තක ඉඩම්වල මිනිරන් බදුදීමේ විධිවිධාන අනුව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනවා ඇත.

2. බදුදීමේ පළමුවෙනි වාරයට අවුරුදු 5කට වේ. තවත් අවුරුදු 5කට බද්ද අළුත්කිරීමට බදුගන්නා අයට මුළු බලය තිබේ.

3. බද්දේ කොන්දේසි සහ ඉඩම් කැබලිවල සිතියම් රත්නපුරේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

වර්ෂ 1940ක්වූ මැයි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

උප ලේඛනය.

| ඉඩම් විස්තරය සහ බිම්ප්‍රමාණය. | පිහිටීම. | පටන්ගත් මිලයත් මුදල රු. ශ. | | බදුමුදල නොහොත් රෝයල්ටි මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 1. නො. 250 පැලෑනේ ලොට් නො. 231 සහ 236යේ කොටස්වන 231(A), 236(B) සහ ලොට නො. 233 නැමති තුනගේහේන සහ තුනගේහේනදෙනිය, අක්කර 3, රූඩ් 1, පර්චස් 20ක් පමණය | කුකුළුකෝරළේ කුකුළේගම | 250 0 | .. | 250 0 (අවුරුද්දකට අක්කරයට ගෙවියයුතු මුදල) |

| ඉඩම් විස්තරය සහ බිම්ප්‍රමාණය. | පිහිටීම. | පටන්ගත් ප්‍රමියන් මුදල රු. ශ. | බදුමුදල නොහොත් රෝයල්ටි මුදල රු. ශ. |
|---|---|---|---|
| 2. නො. 1කේ පැලෑනේ ලොට් නො. 27G හල්දෙලේ හේන නොහොත් ඩූන්හේන, අක්කර 2ක් පමණය | කුකුළුකෝරළේ දෙල්ගොඩ | 500 0 .. | 125 0 (අවුරුද්දකට අක්කර යට ගෙවියයුතු මුදල) |
| 3. නො. 218 පැලෑනේ ලොට් නො. 121 නැමති කොත්ත පිටහේන, අක්කර 2ක් පමණය | කුරුවිටි කෝරළේ යටිපව්ව | 100 0 .. | 100 0 ( එම ) |
| 4. නො. 219 පැලෑනේ ලොට් නො. 545½ සහ 551 නැමති කිරිල්ලවලහේන, රූඩ් 3ක් සහ පර්චස් 1ක් පමණය | කුරුවිටි කෝරළේ කරදන | 150 0 .. | 100 0 ( එම ) |
| 5. නො. 219 පැලෑනේ ලොට් නො. 324 නැමති කිත ගහමිලමුකලාන, අක්කරයක් පමණය | එම .. | 100 0 .. | 125 0 ( එම ) |

---

No. 13,826, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1940ක්වූ ජූලි මස 10වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ උඩුකිඳ කොඩාසයේ යටිපලාත කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 15ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 441. ගම—හහකඩිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 3 | ගල්පොතුකපිගේවත්ත | කිත්තන් පෙරියතම්බි විසින් වැඩිපුර අල්වාගන තිබෙන බිම් කපිටිය | හේ | .. 0 0 6 |
| 5 | එම .. | (1) කිත්තන් පෙරියතම්බි විසින් වැඩිපුර අල්වාගන තිබෙන බිම්කපිටිය, (2) නුවරඑළියේ මහාගස්තොටවත්තේ පදිංචි පී. ඇස්. කච්චරවේල් කන්ගානි | එම | .. 0 1 30 |
| 54 | බෝකොටුවේහේන .. | අඹගස්දෙවේ පදිංචි ජයසේකරමුදියන්සෙලාගේ පුංචිරාල වෙදරාල | හේන | .. 0 0 39 |
| 99 | ගල්පොතුකපිගේපතන | හහකඩියේ පදිංචි පිණා වෙල්ලයන් .. .. | පතන | .. 1 0 9 |
| 111 | පේරලන්ද .. | තුප්පිටියේ පදිංචි මානිලකමුදියන්සේලාගේ පුංචිරාල .. | හේන | .. 0 0 23 |
| 112 | එම .. | හහකඩියේ පදිංචි හේවරදලාගේ හෙන්ද්‍රික් අප්පුහාමි .. | එම | .. 0 1 4 |
| 117 | කුඩාවැවේහේන .. | උඩපුස්සැල්ලාවේ පදිංචි ඇම්. පී. හෙන්ද්‍රික් සිල්වා .. | එම | .. 1 2 33 |
| 124 | දියකඩේවත්ත .. | හහකඩියේ පදිංචි සමරසේකර අයාපත්මුදියන්සෙලාගේ ඩිංගිරිමැනිකා | වත්ත | .. 0 0 10 |
| 128 | කින්නරකොටුවේහේන | උඩකුඹුරේ පදිංචි දිඹුල්ගහවත්තේගෙදර කිරිමැනිකා .. | හේන | .. 0 1 0 |
| 137 | ගොඩමුදුනේහේන .. | (1) හහකඩියේ පදිංචි පෙරමුනේආච්චිල්ලාගේ සිරිබද්දනා, (2) එම සියාතු (3) එම හීන්මැනිකා සහ තවත් අය | එම | .. 0 1 38 |
| 143 | කුඩාවැවේවත්ත .. | හහකඩියේ පදිංචි යාපාමුදියන්සෙලාගේ අප්පුහාමි .. | වත්ත | .. 0 1 3 |
| 144 | එම .. | හහකඩියේ පදිංචි පෙරමුනේආච්චිල්ලාගේ අප්පුහාමි .. | එම | .. 0 1 2 |
| 153 | වලිමිනිවත්ත .. | නාරන්ගල පදිංචි මුනා මාවන්නා කඩිජඋම්මා සහ තවත් අය දෙදෙනෙක් | හේන | .. 0 0 29 |
| 154 | එම .. | බදුල්ලේ කන්දේගෙදර පදිංචි මුනා මාවන්නා අල්ලාපිච්චේ .. | එම | .. 0 0 31 |
| 159 | හීනඇලපොතපතන . | වැලිමඩ පදිංචි ඒ. පී. ජයවර්ධන .. .. | පතන | .. 1 0 1 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිපුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

No. 13,327, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1940ක්වූ ජූලි මස 10වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ උඩුකිඳ කොඩාසයේ යටිපලාත කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 501. තෙල්හාවඩියගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 29 | ගල්ලිදමුල්ලේවත්ත .. | (1) තෙල්හවඩිදුරයලාගේ සිරිපිනා, (2) ජුංසේඅප්පු බාජ්, (3) නුවරඑළියේ කැලේගාල (නොහොත් නුවරඑළියේ කුවීන්ස් කොටේජ්ති) පදිංචි බී. සිංඤෝඅප්පු හාමේ විදානේආරච්චිගේ තෝහමිමා | වත්ත | .. 0 2 0 |
| 30 | ගල්ලිදමුල්ලේපතන . | (1) තෙල්හවඩිදුරයාලාගේ මද්දිලියා, (2) නුවරඑළියේ කැලේගාල (නොහොත් නුවරඑළියේ කුවීන්ස් කොටේජ්ති) පදිංචි බී. සිංඤෝඅප්පු හාමේ විදානේආරච්චිගේ තෝහමිමා | පතන | .. 0 1 14 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිපුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

No. 13,328, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ උඩුකිඳ කොඩාසයේ යටිපලාත කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 440. ගම—වැවගෙදරගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 125 | ජම්පනාවත්ත .. | විජේතුන්ගමුදියන්සෙලාගේ කිරිබංඩා හිටපු ගමරාල .. | වත්ත | .. 0 1 33 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිපුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

**No. 13,329, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමතියකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොරළයේ මැදපලාතකෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 483. ගම—තවලන්පොල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කිරියගල්ල, ඇම්හර්ස්ට් වත්ත | සීමාසහිත ඇංග්ලෝ සිලෝන් සහ ජෙනරල් වතු සමාගම, ඒජන්තවරු, කොළඹ සීමාසහිත බොසිස් බුද්‍රර්ස් සමාගම | මැලියන්ගස්, වැවිල්ල | 10 3 7 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,330, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොරළයේ මැදපලාතකෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 486. ගම—පල්ලේවෙල්ලේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 57 | හාගේවැටුනුඇල්ලේ හේන | (1) කුරකඹුරේ පදිංචි රාජපක්ෂදුරයාලාගේ හවඩියා, (2) පිටවෙල පදිංචි එම මහිම්, (3) එම පොඩිහා සහ (4) එම කොන්දි | හේන | .. 0 2 0 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,331, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමතියකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොරළයේ මැදපලාතකෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 464. ගම—කඩදෙරගම (කොටසක්).

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 56 | මිව්වමල්වත්ත .. | (1) බෝරලන්දේ පදිංචි පීරිස් සමරවික්‍රම, (2) කඩදෙරගම පදිංචි බබිනෝනා සමරවික්‍රම, (3) බෝරලන්දේ පදිංචි පී. ඇම්. සමරවික්‍රම සහ (4) ඇලිස්නෝනා සමරවික්‍රම | හේන | .. 0 3 34 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,332, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොරළයේ මැදපලාතකෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 425. ගම—කිරවානගම (කොටසක්).

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වෙල්ඕමාර්වතුයාය . | සීමාසහිත ලුණෝවා ටී සහ රබර් සමාගම, කොළඹ සීමාසහිත හැරිසන් සහ ක්‍රොස්ෆීල්ඩ් සමාගම (ඒජන්තවරු) | ටී | .. 0 2 10 |
| 2 | එම .. | සීමාසහිත ලුණෝවා ටී සහ රබර් සමාගම විසින් අල්ලාගෙන තිබෙන බිම්කට්ටිය, කොළඹ සීමාසහිත හැරිසන් සහ ක්‍රොස්ෆීල්ඩ් සමාගම (ඒජන්තවරු) | එම | .. 1 0 0 |
| 154 | කටකිතුලාවගාර .. | අලුත්ගෙදර ආර්. ඇම්. ගනේතිරල විසින් අල්ලාගෙන තිබෙන බිම්කට්ටිය | එම | .. 0 0 10 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක්වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, එවාගේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,333, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමතියකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොරළයේ උඩපලාතකෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 451. ගම—මඩමිට ඉඩංමිගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 121 | අරංවෙහේන .. | තෙන්නකුඹුරේ පුංචිබණ්ඩා, එම හීන්බණ්ඩා, එම කිරිබණ්ඩා, එම පිකිරිබණ්ඩා, ඒ. ආර්. ඩබ්ලිව්. ඇජ්. හීන්බණ්ඩා, එම පුංචිබණ්ඩා, එම කිරිබණ්ඩා, එම පිකිරිබණ්ඩා | හේන | .. 0 2 4 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

**No. 13,334, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බෘහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ උඩපලාතකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 453. ගම—කරගහවෙල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 83 | හපුතනුවගොඩපතන | පල්ලේගෙන්පොතෝ අලුත්ගෙදර රත්න .. .. | පතන .. | 1 | 0 | 6 |
| 85 | එම .. | මැටිකුඹුර පදිංචි ඩබ්ලිව්. බී. සිරිපිනා .. .. | එම .. | 0 | 0 | 35 |

තක්සේරු මිල අක්ෂරයෙන් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 13,335, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බෘහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ උඩපලාතකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 458. ගම—අලවතුගොඩ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 288 | වටගොඩ .. | (1) අලවතුගොඩ පදිංචි නවරත්නමුදියන්සෙලාගේ රන්මැනිකා, (2) කලුබුල්ලන්දේ පදිංචි රත්නායකමුදියන්සෙලාගේ හීන් මැනිකා | පතන .. | 0 | 2 | 4 |

තක්සේරු මිල අක්ෂරයෙන් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 13,336, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1940ක්වූ ජූලි මස 11වෙනි දිනවූ බෘහස්පතින්දා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ යටිපලාතකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 450. ගම—බුස්දුල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 148 | අලුපලව්වෙපතන .. | ජයසුන්දරයලාගේ හොබනී, ජයසුන්දරයලාගේ රන්කිරිය, ජයසුන්දරයලාගේ සුද්දනා, එම රත්නා, එම සොඳිනා, එම හෝමිනේ | පතන .. | 1 | 1 | 4 |
| 157 | එම .. | ජයසුන්දරවිරුදුරයලාගේ තිඹුන, එම මානිම් සහ එම සිරිපිනි .. | එම .. | 1 | 0 | 7 |
| 158 | එම .. | ජයසුන්දරවිරුදුරයලාගේ ලැයිස සහ එම හෝමිනේ .. | එම .. | 1 | 0 | 6 |
| 162 | දුනුගේ ගොල්ලේ පතන | ගල්බොක්කගේවගේ චාර්ලිස්සිංඤෝ .. .. | එම .. | 1 | 0 | 4 |
| 170 | අලුගොල්ලේපතන | පිනාහාගේ සීලාවතී .. .. .. | එම .. | 0 | 1 | 20 |
| 176 | අලුගොල්ලේවත්ත | ආණ්ඩුව .. .. .. | හේන .. | 0 | 1 | 17 |
| 180 | එම .. | පිනාහාගේ සීලාවතී .. .. .. | එම .. | 0 | 0 | 25 |
| 185 | අලුගොල්ලේහේන .. | පිටකොටුවාහාගේ දවිත්අප්පු, එම අංදිරිස් සහ එම හෙන්ද්‍රික්සිංඤෝ | එම .. | 0 | 0 | 35 |

තක්සේරු මිල අක්ෂරයෙන් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 13,337, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1940ක්වූ ජූලි මස 12වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ යටිපලාතකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 495. ගම—කරගහඋල්පොත.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප |
|---|---|---|---|---|---|---|
| 53 | නාරන්ගහකොටුව නොහොත් බෝගහමුලහේන | පට්ටිගේකුඹුරේගෙදර සිරිබද්දනා .. .. | හේන .. | 0 | 3 | 12 |
| 54 | බෝගහමුලහේන .. | ඌවඇල රන්තියාවත්තේගෙදර කිරල අප්පුහාමි .. | එම .. | 0 | 2 | 32 |

තක්සේරු මිල අක්ෂරයෙන් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 13,338, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1940ක්වූ ජූලි මස 12වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ යටිපලාතකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 6ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 448. ගම—ජයසින්ගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 60 | බෝගහහින .. | කහවෙකොරල්ලගේ දොන් ඩේවිඩ් පෙරේරා .. .. | පතන .. | 1 | 0 | 10 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 65 | සොහොන්පොලකපල්ල, බෝගහහේන | කහවිතකාරල්ලගේ දොන් ඩේවිඩ් පෙරේරා .. | .. පතන | .. 1 0 9 |
| 72 | සොහොන්පොලකප්පල්ල | ජයසිංහසමරකෝන්මුදියන්සේලාගේ සිරිවතීන .. | .. එම | .. 0 1 27 |
| 75 | එම .. | ජයසිංහමුදියන්සේලාගේ පුංචිරාලගේ හිංගිරිමැණිකා | .. හේන | .. 0 2 4 |
| 76 | එම .. | ජයසිංහමුදියන්සේලාගේ පුංචිරාලගේ පුංචිමැණිකා | .. එම | .. 0 2 7 |
| 77 | කොස්අත්තයාබටුවේ පතන | ජයසිංහමුදියන්සේලාගේ පුංචිරාලගේ අප්පුහාමි .. | .. එම | .. 0 2 1 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,339, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1940ක්වූ ජූලි මස 12වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට පාලුගම සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ උඩුකිද කොටසයේ මැදපලාතකෝරලේ පිහිටා තිබෙන සිම්කැබලි 14ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 429. ගම—පව්වියකුඹුර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 29 | ඒදන්ඩඅරණේහේන .. | උඩපුස්සැල්ලාවේ පදිංචි ජෙෆ්රිකා ක්‍රිස්තියන් වාර්නෝර්ඩ් සහ දික්ඔය පදිංචි හියු මිඩල්ටන් ගෝර්ඩන් | හේන | .. 0 0 23 |
| 33 | ලියන්ගහවෙලහේන .. | එම .. .. .. | එම | .. 2 1 30 |
| 55 | මැදහින්නවත්ත .. | පව්වියකුඹුර පදිංචි මාරසිංහමුදියන්සේලාගේ කිරිබන්ඩ නීටපු ගමරාල, (2) දියකොල පදිංචි රත්නායකමුදියන්සේලාගේ පුංචිමැණිකා, (3) පනාකන්නිය පදිංචි දිසානායකමුදියන්සේලාගේ පුංචිබන්ඩ, (4) පව්වියකුඹුර පදිංචි රත්නායකමුදියන්සේලාගේ බන්ඩ, (5) බොකනෝරුව පදිංචි එම හුදුමැණිකා, (6) කනෙදෙගෙදර පදිංචි දිසානායකමුදියන්සේලාගේ අප්පුහාමි, (7) පනාකන්නියෙ පදිංචි එම ලොකුමැණිකා, (8) කොටවෙර පදිංචි රත්නායකමුදියන්සේලාගේ උක්කුමැණිකා | වත්ත | .. 1 1 36 |
| 73 | ගාල්පව්වියවත්ත .. | උඩපුස්සැල්ලාවේ පදිංචි ජෙෆ්රික් ක්‍රිස්තියන් වාර්නෝර්ඩ් සහ දික්ඔය පදිංචි හියු මිඩල්ටන් ගෝර්ඩන් | හේන | .. 2 2 28 |
| 79 | ඇලෙන්උඩහේන .. | මාරසිංහමුදියන්සේලාගේ උක්කුබන්ඩ, කිරිබන්ඩ සහ රත්නායක මුදියන්සේලාගේ බන්ඩ | එම | .. 0 1 17 |
| 80 | එම .. | උඩපුස්සැල්ලාවේ පදිංචි ජෙෆ්රික් ක්‍රිස්තියන් වාර්නෝර්ඩ් සහ දික්ඔය පදිංචි හියු මිඩල්ටන් ගෝර්ඩන් | එම | .. 0 2 5 |
| 134 | ලියන්ගහවෙලහේන .. | එම .. .. .. | එම | .. 3 0 1 |
| 141 | ලියන්ගහවෙලහේන, මානවෙලහේන | එම .. .. .. | එම | .. 3 0 0 |
| 146 | මානවෙලහේන .. | කුඹල්වෙලකෝරලේ බඹරගම පදිංචි ජේනා හානා කුට්ටිඅයිය | එම | .. 1 2 3 |
| 147 | එම .. | නමුනුකුලකන්දගේනවත්තේ පදිංචි රාමසාමි ගෝවින්දන් කන්කානි | එම | .. 0 1 39 |
| 149 | එම .. | කොටවෙර පදිංචි මාරසිංහමුදියන්සේලාගේ කිරිබන්ඩ, එම එම හුදුබන්ඩ, එම එම පුංචිබන්ඩ, එම එම කිරිවත්තෙ | එම | .. 0 2 0 |
| 156 | මැදහින්නේහේන .. | කොටවෙර පදිංචි මාරසිංහමුදියන්සේලාගේ උක්කුබන්ඩ .. | එම | .. 0 1 19 |
| 159 | අගම්වවත්ත .. | අඹුනුපෙදුව පදිංචි රත්නායකමුදියන්සේලාගේ සුජාතාවතී, එම කිරිමැණිකා, එම පුංචිමැණිකා, වැලිමඩ පදිංචි සුදුබංඩා රත්නායක | එම | .. 1 2 6 |
| 164 | ඇලෙන්උඩහේන, ඇල්ලපිටහේනහේන | පව්වියකුඹුර පදිංචි මාරසිංහමුදියන්සේලාගේ කිරිබන්ඩ, දියකොල පදිංචි රත්නායකමුදියන්සේලාගේ පුංචිමැණිකා, පව්වියකුඹුරේ පදිංචි එම බන්ඩ, බොකනෝරුවේ පදිංචි එම හුදුමැණිකා, කොටවෙර පදිංචි එම උක්කුමැණිකා, පනාකන්නියේ පදිංචි දිසානායකමුදියන්සේලාගේ ලොකුමැණිකා | එම | .. 0 2 38 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,340, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1940ක්වූ ජූලි මස 12වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10ට කුරුවිටදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ කුරුවිටිකෝරලේ උතුරු උඩපත්තුවේ පිහිටා තිබෙන සිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 395. ගම—වීතරම්පන්ගුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 122 | කිරිගලපල්ලේහේන, අලුබෝගහගාවහේන, කිරිගලගාවහේන | එරත්නේ පදිංචි මුරුත්තැම්ටුවේ ගමමැතිරාලලාගේ මුදියන්සේ, රිජිස්ට්‍රාර්තැන | හේන | .. 7 3 12 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒකේ සිතියම කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1940ක්වූ මැයි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කොළඹ-බියගම්පාරේ කල්වත්තේ බැම්මට ගල්පතුරු ඇල්ලීම සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම් සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැමිරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,144. ගම—කල්වත්ත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බටදෙඹගහඹිට .. | ගල්පතුරු අල්ලනලද ආණ්ඩුවේ පාරේ බැම්මේ කොටසකින් යුත් තණකොල කොටුව | කනකරත්නමුදියන්සෙලාගේ ජුවන් පෙරේරා, කරම්වගේ සොපියා අල්විස්, කනකරත්නමුදියන්සෙලාගේ රෝජුස් පෙරේරා, කනකරත්නමුදියන්සෙලාගේ නිකුලස් පෙරේරා, එම මරිය පෙරේරා, එම [illegible] පෙරේරා සහ එම මාර්තා පෙරේරා, ගෝනවල, එම රත්නො පෙරේරා, මාවල්ගම, වග | 0 0 5·4 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැම්දෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ ජූනි මස 12වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ මැයි මස 13වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ආර්. ඇස්. බී. පෙරේරා,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

———

ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට ඒනම්:—රත්තොට නගරයේ කුණුකසල ආදිය වැලලීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රී සභාවට උතුමාණන්වහන්සේගෙන් පැමිරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 626. ගම—කුරුවාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1–10 | පැපොලයාගේ වත්ත හොහොත් බට්ටගේ කුඹුර | වත්ත .. | (1) වේරගම පදිංචි ආර්. උදලාගම කුමාරිහාමි, (2) දුල්ලෑවේ පදිංචි ආර්. බී. දුල්ලෑවේ (3) කබුගන්නාවේ පදිංචි කොබ්බෑකඩුවේ කුමාරිහාමි, (4) දුල්ලෑවේ පදිංචිව සිටි විකිරිකුමාරිහාමිගේ උරුමක්කාරයන් | 2 0 34 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැම්දෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ ජූනි මස 14වෙනි උදේ 10ට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ මැයි මස 13වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

ඩී. ඩබ්ලිව්. බී. බැරන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

———

(203වෙනි පරිච්ඡේදය—ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රය යටතේ) ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—දික්වැල්ල-බෙලිඅත්තපාරේ තුන්වෙනි හැතැප්ම දියුණුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" (203වෙනි පරිච්ඡේදය) 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

අවසාන ගම් සිතියමේ නො. 301, අතුරු සිතියමේ නො. 4. ගම—ගලගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 293 | සියඹලාගහකුඹුර .. | කුඹුර සහ කන්ඩිය .. | දික්වැල්ලේ සිට නැසීගිය නාඋරුන්නෙගේ දෙන් අන්ද්‍රයස් සහ ගලගම පදිංචි නානායක්කාරතැන්ගේ ඩින්ගිහාමි | 0 0 4·30 |
| 294 | අඹගහකුඹුර .. | අවුරුදු 6ක් වයස ඇති මුරුන්ගාගස් 1ක්ද, අවුරුදු 2ක් වයස ඇති පුවක් ගස් 1ක්ද, අවුරුදු 3ක් වයස ඇති කොහොඹගස් 1ක්ද ඇති වත්ත | ගලගම පන්සැලේ කේ. සෝනුත්තර තෙරුන්නාන්සේ | 0 0 0·73 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැම්දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ ජූනි මස 20වෙනි දින සවස 2.30ගේ කනිසමට කහවත්තේ ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ මැයි මස 9වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

———

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—දිප්පිටියේ මුස්ලිම් පාඨශාලාව සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 279. ගම—දිප්පිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පල්ලේවත්ත .. | අරඹ .. | පී. ඇස්. සුල්වා මරික්කා සහ අලියා මරික්කා අබ්දුල් වහාබු | 0 0 24·1 |
| 2 | එම .. | පොල්වත්ත .. | සුලෙයිමාන් ලෙබ්බෙ මොහමඩු සහ ආනා සාලියාඋම්මා .. | 0 0 23·3 |
| | | | | 0 1 7·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝනොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වශි 1940ක්වූ ජූනි මස 28වෙනි දින පෙරවරු 11.30ගේ කාලයට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වශි 1940ක්වූ මැයි මස 8වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්. ආර්. අමරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වශිහ.

---

(ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට) ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අළුත් රබර් වැවීමේ ක්‍රමය යටතේ ඉඩම් මාරුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගෝර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම :—

මුල් සිතියමේ නො. A 268. ගම—පැලැම්පිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | ලංකාවේ වතුකාර එක්සත් සමාගම (කොළඹ බවුස්ටඩ් සහෝදර, ඒජන්තවරු) | 11 | 1 | 2 |
| 2 | එම .. | එම .. .. .. | එම .. .. | 21 | 3 | 23 |
| 3 | — .. | ගන්සහාපාර .. .. | එම .. .. | 0 | 0 | 10 |
| 4 | — .. | එම .. .. .. | එම .. .. | 2 | 1 | 17 |
| 5 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් සහ සිර ගොඩනැගිල්ලක් (කම්කරුවන්ගේ නිවාසය) තිබේ | එම .. .. | 14 | 0 | 14 |
| 6 | එම | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් සහ සිර ගොඩනැගිල්ලක් (කෝපිල) තිබේ | එම .. .. | 20 | 0 | 12 |
| 7 | — .. | අඹිපාර .. .. .. | එම .. .. | 0 | 0 | 1 |
| 8 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් සහ සිර ගොඩනැගිල්ලක් තිබේ | එම .. .. | 80 | 2 | 32 |
| 9 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 1 | 3 | 33 |
| 10 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 5 | 3 | 37 |
| 11 | එම | එම .. .. | එම .. .. | 41 | 0 | 16 |
| 12 | සැන්ඩ්රම්බෝල්ඩ්ස් | අවුරුදු 10 සිට 20 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 12 | 3 | 2 |
| 13 | එම | එම .. .. .. | එම .. .. | 3 | 0 | 17 |
| 14 | — .. | ගන්සහාපාර .. .. | එම .. .. | 0 | 2 | 31 |
| 15 | සැන්ඩ්රම්බෝල්ඩ්ස් | අවුරුදු 10 සිට 20 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 8 | 0 | 21 |
| 16 | එම | ලඳුකැලෑ කම්පි ඇති පතන | එම .. .. | 60 | 1 | 6 |
| 17 | — .. | ගන්සහාපාර .. .. | එම .. .. | 0 | 0 | 28 |
| 18 | සැන්ඩ්රම්බෝල්ඩ්ස් | අවුරුදු 10 සිට 20 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 12 | 2 | 35 |
| 19 | එම .. | අත්හරිනලද තේපඳුරු ඇති පතන .. | එම .. .. | 1 | 3 | 38 |
| 20 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 0 | 0 | 22 |
| 21 | — .. | වයස අවුරුදු 10 සිට 30 දක්වා රබර්ගස්තුනක් සහ දරගහක්ද ඇති පාර | එම .. .. | 0 | 0 | 18 |
| 22 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්ව වයස ඇති රබර් .. | එම .. .. | 0 | 2 | 13 |
| 23 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 0 | 0 | 15 |
| 24 | — .. | එම .. .. .. | එම .. .. | 0 | 0 | 9 |
| 25 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 8 | 0 | 32 |
| 26 | එම .. | එම .. .. .. | එම .. .. | 5 | 1 | 26 |
| 27 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 0 | 1 | 26 |
| 28 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 1 | 1 | 9 |
| 29 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 0 | 0 | 14 |
| 30 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 2 | 3 | 15 |
| 31 | එම .. | එම .. .. .. | එම .. .. | 2 | 3 | 23 |
| 32 | එම .. | එම .. .. .. | එම .. .. | 3 | 1 | 31 |
| 33 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 0 | 2 | 27 |
| 34 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 30 | 1 | 15 |
| 35 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 0 | 0 | 30 |
| 36 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 2 | 0 | 25 |
| 37 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 0 | 0 | 2 |
| 38 | — .. | එම .. .. .. | එම .. .. | 0 | 0 | 15 |
| 39 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 2 | 2 | 22 |
| 40 | එම .. | තැන්තැන්වල අත්හැර තිබෙන තේ පඳුරු ඇති පතන | එම .. .. | 30 | 1 | 19 |
| 41 | — .. | වතුපාර .. .. .. | එම .. .. | 0 | 0 | 17 |
| 42 | සිංෆේජන් .. | අවුරුදු 10 සිට 30 දක්වා වයස ඇති රබර් .. | එම .. .. | 67 | 1 | 17 |
| | | | | 448 | 3 | 17 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝනොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වශි 1940ක්වූ ජූලි මස 3වෙනි දින පෙරවරු 10ගේ කාලයට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වශි 1940ක්වූ මැයි මස 3වෙනි දින කෑගල්ල කච්චේරියේදීය.

ආර්. ආර්. අමරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වශිහ.

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

### මධ්‍යම පළාතෙහි ඉඩම්දීමට පවත්වන්ට යෙදෙන ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපනතට අනුව කළුතර උප දිසාපතිතුමා වර්ෂ 1940ක්වූ ජූනි මස 20වෙනි දින උදේ 10ට කළුතර කච්චේරියේදී මෙහි පහත විස්තර කරනලද ඉඩම්වලට ඉල්ලුම්පත්‍ර භාරගන්නා බවද, එකී ඉල්ලුම්පත්‍රකරුවන් ඉඩම්දීමට සුදුසු අය පරීක්ෂාකොට කල්පනාවට ගන්නා බවද මෙයින් දැනුම්දෙමි.

1. මෙහි පහත සඳහන් ඌරගොඩ යන ගමෙහි මධ්‍යම ක්‍රමයට දැනට ඉඩම් ලැබී තිබෙන අයවලුන්ට එම ගමෙන් නව ඉඩම්දීමට සුදුසු අය පරීක්ෂාකොට කල්පනාවට ගන්නා බවද, මෙම ගමේ කලින් ඉඩම් දී තිබෙන අයවලුන්ගෙන් ඔප්පු දීමට සුදුස්සන්ද තෝරාගනු ලැබේ.

2. ඉල්ලුම්කරන්ට සතුවූ අය නො. L. C. 44 දරණ පෝරම් කොළ කළුතර උප දිසාපතිතුමාගෙන් ලබාගෙන වර්ෂ 1940ක්වූ ජූනි මස 10වෙනි දිනට මත්තෙන් ඉල්ලුම්කළ යුතුයි. ඒ දිනට පසු ලැබෙන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද ඉහතකී පෝරම්කොළවල හැර වෙන අන්දමකින් එවන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

3. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙන මුදලක් ඒ ඉල්ලුම්පත්‍රය සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරණ තීරණය අවසාන තීරණය වන්නේය.

4. ඉඩම් ඉල්ලුම්කරණ අය තමතමන්ම ඉඩම් කච්චේරිය පවත්වන දිනට කළුතර කච්චේරියට නියම වේලාවට පැමිණිය යුතුයි. තමාටම පැමිණිය නොහැකි කරුණක් වුවොත් ඒ වෙනුවට වෙන කෙනෙක් එවිය යුතුයි. ඉල්ලුම්කරුවෝ හෝ ඒ වෙනුවට වෙන කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් එම ඉල්ලුම්කරුවන් විසින් එවන්ට යෙදුන ඉල්ලුම්පත්‍ර ගැන වැඩිදුරට ඔවුන් උනුව නොවන බව කල්පනා කරමි.

5. මෙහි පහත සඳහන් කරුණු මේ දැන්වීමෙහිදී ඉඩම් ලැබෙන අයට දෙන බලපත්‍රයේ අන්තර්ගත කරුණුත් සමග අඩංගුවේනවා ඇත.

(*a*) බලපත්‍රධාරී භාර තැනැත්තා විසින් පොල්, කොස්, පුවක් යනාදිය ඉඩමේ වැවිය යුතුයි.

| | |
|---|---|
| අවුරුදු 3ක් අවසානවෙන්ට මත්තෙන් | සම්පූර්ණ ඉඩමෙන් 3/10ක් වැවිය යුතුයි. |
| අවුරුදු 5ක් අවසානවෙන්ට මත්තෙන් | සම්පූර්ණ ඉඩමෙන් ½ක් වැවිය යුතුයි. |
| අවුරුදු 6ක් අවසානවෙන්ට මත්තෙන් | සම්පූර්ණ ඉඩමෙන් ¾ක් වැවිය යුතුයි. |

කළුතර උප දිසාපතිතුමාගෙන් අවසරයක් ලබානොගෙන රබර් හෝ තේ වැවීම කළනොහැකිය.

(*b*) ගුලවිට ඉඩම් අක්කරයකට රු. 60 බැගින්ද, ඌරගොඩ ඉඩම් අක්කරයකට රු. 85 බැගින් දැනට තක්සේරුකර තිබෙන මුදලෙන් සියයට 4 බැගින් ගණන්බලා තමතමාට ලැබෙන අක්කර ගණනට අවුරුදුපතා ආණ්ඩුවට ගෙවිය යුතුයි.

6. උප දිසාපතිතුමා මැනවයි පිළිගන්නාලෙස ඉඩම් සශ්‍රීක කරතිබෙන බලපත්‍ර භාර තැනැත්තාට පහත සඳහන් විශේෂ කරුණු ඉෂ්ටකරණවා ඇත.

(*a*) මුල අවුරුදු 3යේදී අවුරුද්දකට ගෙවියයුතු මුදලෙන් සියයට 50ක් අඩුකරණු ලැබේ.

(*b*) අවුරුදු 4, 5 සහ 6යේදීත් අවුරුද්දකට ගෙවියයුතු සම්පූර්ණ මුදල අයකරණු නොලැබේ.

7. මෙහි පහත සඳහන් ඉඩම්වල පිඹුරු හෝ කට්ටුසටහන් ගෙවියයුතු ගාස්තු ගෙවා සර්වේයර් ජනරාල්තුමාගෙන් ලබාගතහැක. මේ දැන්වීම ගැන වැඩි විස්තර කළුතර උප දිසාපතිතුමාගෙන් දැනගත හැක.

### දීමට යන ඉඩම්වල විස්තර.

මුල් පැලෑනේ නො. 89. ගම—ගුලවිට.
කෝරළය—බස්නාහිර පස්දුන්කෝරළේ.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 202 | .. හල්වලමූකලාන .. | මූකලාන | 66 | 3 | 20 |

මුල් පැලෑනේ නො. 83. ගම—ඌරගොඩ.
කෝරළය—බස්නාහිර පස්දුන්කෝරළේ.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 125 (කොටසක්) | ඇල්ලෙකන්ද .. | මූකලාන | 97 | 2 | 1 |
| 40D .. | එම .. | එම | 59 | 1 | 13 |

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

වර්ෂ 1940ක්වූ මැයි මස 9වෙනි දින ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

---

## 1920සේ නොම්බර 11 දරණ ප්‍රදේශික ආණ්ඩු ව්‍යවස්ථාව.

ගම්පල නාගරික ප්‍රදේශික සභාවේ නො. 1 දරණ කොට්ඨාසයට සාමාජිකයෙක් තෝරාගැනීම පිණිස තේරීම් රැස්වීමක් පැවැත්වීමට අදහස්කර තිබේ.

සාමාජිකයෙක්වීමට ඉල්ලුම්කරණ තැනැත්තාගේ නම ලියවිල්ලකින් යෝජනා කළ යුතුයි. ඉල්ලුම්පත්‍රය අනුවගයෙන් ඉල්ලුම්කරු ඉදිරිපත්වීමට අදහස්කරන කොට්ඨාසයේ ඡන්දදායකයින්ගේ නාමලේඛනයේ නාම පෙනෙන දෙදෙනෙකු විසින් අත්සන්කරන්ට ඕනෑ. පමණකුත් නොව එම ඉල්ලුම්පත්‍රය වර්ෂ 1940ක්වූ ජූනි මස 24වෙනි සඳුදා පෙරවරු 10ට පෙර ප්‍රථම ගම්පල නාගරික ප්‍රදේශ සභා කන්තෝරුවේදී භාරදිය යුතුයි.

මෙම කොට්ඨාසයට එක ඉල්ලුම්කරුවකුට වැඩි ගණනක් යෝජනාකරණු ලැබුවොත් නම් සාමාජිකයෙක් තේරීම සඳහා වර්ෂ 1940ක්වූ ජූලි මස 5වෙනි සිකුරාදා ගම්පල පරන ඇක්සයිස් කන්තෝරුවේදී ඡන්දයගැනීම කරනු ලැබේ. ඡන්දය ගැනීම උදේ 9ට පටන්ගෙන සවස 1ට සමාප්ත කරනු ලැබේ.

ඒ. වී. ඔසියන්,
මධ්‍යම දිසාවේ ඒජන්තතුමා.

වර්ෂ 1940ක්වූ මැයි මස 13වෙනි දිනදීය.

---

## අන්‍ය දැන්වීම්.

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ කුඹුකේ පදිංචි බැද්දගේ ගබ්‍රියෙල්සොයිසා වන මම කළුතර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් වැඩකරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට පත්කරනු ලබන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූවායින් පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම් කරන බව වර්ෂ 1907සේ අංක 1 දරණ ආඥාපණතේ 1B ෂැඩ්‍යුල් පත්‍රයේ 2වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දී සිටිමි.

19, මාර්තු 1940. බී. ගබ්‍රියෙල්සොයිසා.
කුඹුක, ගෝනපල, කැස්බෑව.

---

මෙහි පහත නම් සඳහන් මහාකණපතිකුරුන්කල් රාමලිංගන් අයියාර් වන මම යාපනේ දිස්ත්‍රික්කයට අයත් කාන්කේසන්තුරය සහ චුන්නාගම්හිත් දෙමළ භාෂාවෙන් කටයුතුකරන නොතාරිස් කෙනෙක් හැටියට දැනුම්දෙමි.

27. 4. 40 M. Ramalinga Iyar.

---

කන්කසන්තුරේ පදිංචි අරමූගම් විනාසිතම්බි වන මම ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාවෙන් ඔප්පු ලිවීමේ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙක් වශයෙන් කටයුතුකිරීමට අවසර ලබාගන්ට බලාපොරොත්තු වන බව මෙයින් දැනුම්දෙමි.

27. 4. 40. A. Venasithamby.

---

වර්ෂ 1907 නොවැම්බර 1 අටවෙනි ආඥාපනතේ ප්‍රකාර යාපනේ කරම්පන් කයිට්ස්හි පදිංචි පොන්නම්පලම් රාමලිංගම් වන මම ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට පත්වීමට බලාපොරොත්තුවන බැව් මෙයින් දැනුම්දෙමි.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.